*සැ. යු.-* 2022.09.02 දින පළ කරන ලද අංක 2296 *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,297 - 2022 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2022.09.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1100 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1101 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1101 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 සැප්තැම්බර් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 සැප්තැම්බර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1099 B 082379 — 403 (2022/09)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2022 අංක 558

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

*2021 අගෝස්තු මස 28 වැනි දින සිට තාවකාලික මේජර් නිලයට*

නි/9243 කපිතන් අකුරන්ගේ උපාලි ජයවර්ධන

නි/9251 කපිතන් එදිරිවීරාරිගේ නිශාන් තරංග

නි/9268 කපිතන් කංකානි ආරච්චි අප්පුහාමිලාගේ නලින්ද වීරරත්න

නි/9269 කපිතන් මුණසිංහ ආරච්චිලාගේ කොරනේලිස් චමින්ද මුණසිංහ

නි/9299 කපිතන් නාගරාජා නරේන්රා

නි/9312 කපිතන් දිසානායක මුදියන්සේලාගේ දිල්හාරා සජීවනි (ගැ)

නි/9322 කපිතන් පරම්වෝදී පරනීදරන්

නි/9449 කපිතන් රත්නායක මුදියන්සේලාගේ තුසිත මංගල අබේසිංහ

*2021 අගෝස්තු මස 29 වැනි දින සිට තාවකාලික මේජර් නිලයට*

නි/7800 කපිතන් අනෝජ් රන්ධීර් ගුණසේකර

නි/7830 කපිතන් හීන්කෙන්ද මුදියන්සේලාගේ සමින්ද කුමාර හීන්කෙන්ද

නි/9404 කපිතන් දිසානායක මුදියන්සේලාගේ දිනේශ් තරංග කුමාර දිසානායක

*2021 අගෝස්තු මස 31 වැනි දින සිට තාවකාලික මේජර් නිලයට*

නි/6388 කපිතන් තන්ත්‍රිගේ දොන් ප්‍රදීප් කවින්ද

නි/7140 කපිතන් පුරිජ්ජල ලිඳගාව ගෙදර වරුණ දීපාල් සමරසේන

නි/7178 කපිතන් ඉඩන් ගෙදර උපේක්ෂ සම්පත් ඔබේසේකර

නි/7810 කපිතන් මහලක්ෂ මුදියන්සේලාගේ සංජීව කුමාර සුගතපාල

නි/7838 කපිතන් ජයවර්ධන ආරච්චිගේ රුවන් කැකුල

නි/7872 කපිතන් අලංකාරයලාගේ දඹුල්ලැවත්තේ චමින්ද සම්පත්

නි/7887 කපිතන් කුරුප්පු මුදියන්සේලාගේ නිරූපා නිල්මිණි කුරුප්පු (ගැ)

නි/8023 කපිතන් තරංග කුමාර නවරත්න

නි/ 8246 කපිතන් දයාරත්නගේ උදය රාජපක්ෂ

නි/8788 කපිතන් නිශාන්ත ප්‍රේමලාල් වියනගේ

නි/8789 කපිතන් දිසානායක මුදියන්සේලාගේ අජිත් සුරංග දිසානායක

නි/8791 කපිතන් හේනේ කංකානම්ගේ දොන් සංජය ක්‍රිශාන්ත අභයරුවන්

නි/8793 කපිතන් දිසානායක මුදියන්සේලාගේ නිලන්ති කුමාරි (ගැ)

නි/8798 කපිතන් බෝදියාබදුගේ මංගල දර්ශණ ජෙරොම් පෙරේරා

නි/8806 කපිතන් බණ්ඩාර මුදියන්සේලාගේ චාමර දේශප්‍රිය දිසානායක

නි/8824 කපිතන් ජයසේකර හෙට්ටි ආරච්චිගේ දර්ශන පැතුම් කුමාර

නි/8877 කපිතන් දනසේකර මුදියන්සේලාගේ දර්ශන කැලුම් බණ්ඩාර

නි/8891 කපිතන් මුහම්මදු සලීම්කාන් මුහම්මදු මිෆ්රාස්කාන්

නි/9080 කපිතන් සිංගාරවේල් පවනිදරන්

නි/9247 කපිතන් සුලෛමාන් මුහම්මදු ශිෆාන්

නි/9255 කපිතන් ගොඩකන්ද ආරච්චිගේ අමිත් ප්‍රියංග

නි/9265 කපිතන් තලා කුඹුර මුදියන්සේලාගේ රොෂාන් වජිර රංගන

නි/9273 කපිතන් බෙමල් එරන්ද සමරසිංහ

නි/9288 කපිතන් කන්දසාමි සිවකුමාර්

නි/9353 කපිතන් නානායක්කාර අපරැකගේ ඉන්දිකා සංජීවනී නානායක්කාර (ගැ)

නි/9366 කපිතන් ඉරුදයනායකම් සසිකුමාර්

නි/9375 කපිතන් දිසානායක මුදියන්සේලාගේ උදේනි දිසානායක

නි/9403 කපිතන් රාජදුරෛ සෙල්වකුමාර්

*2021 සැප්තැම්බර් මස 01 වැනි දින සිට තාවකාලික මේජර් නිලයට*

නි/6105 කපිතන් සැම් නිලන්ත අලුත්වල

නි/5764 කපිතන් හේරත් මුදියන්සේලාගේ ජයනි තක්ෂිලා හේරත් (ගැ)

නි/5921 කපිතන් රංජිත් දිසනායක

නි/6298 කපිතන් බුද්දරගේ ධම්මික ප්‍රසන්න පීරිස්

නි/6417 කපිතන් මුදන්නායකගේ රුවන් ධම්මික තලකොටුව

නි/6564 කපිතන් සුදිරික්කු හැන්නදිගේ මංජුල දමයන්ත

නි/6597 කපිතන් විතානගේ දයාල් නන්දන

නි/6619 කපිතන් මල්ලව ආරච්චිගේ විජිත කැලුම් සමරසේකර
නි/6691 කපිතන් රන්හොට් බණ්ඩාරලාගේ අසේල නලින්ද බණ්ඩාර
නි/6630 කපිතන් පෙත්තමාරු දූරයලාගේ රොෂාන් බුද්ධික
නි/6312 කපිතන් හීන්කෙන්ද මුදලිගේ රංජක පුෂ්පකුමාර
නි/6554 කපිතන් කොස්කොළ වත්තේ ගෙදර කළන සමන් බණ්ඩාර
නි/6043 කපිතන් අරඹේ යාලිංගෙදර බුවනෙක රවීන්ද්‍ර සුමතිපාල
නි/7871 කපිතන් රාජශිල්ප මුලාචාරිගේ සිසිර කුමාර සේනාරත්න
නි/8045 කපිතන් හේවා වසම්ලාගේ රුවන් රාජිත සමරසිංහ
නි/7125 කපිතන් උඩුගොඩ ගෙදර සිසිර කුමාර වික්‍රමසිංහ
නි/8797 කපිතන් රාජකරුණාගේ රත්න දේශප්‍රිය හේරත්
නි/8807 කපිතන් හේනක රාල්ලාගේ ඉන්දික පුෂ්පකුමාර දයාරත්න
නි/9052 කපිතන් වේලේන්ද්‍ර මුල් ආචාරිගේ සම්පත් ඉන්දික චමින්ද
නි/9262 කපිතන් උඩුවැල්ලේ කෝරලේ ගෙදර ජනක බණ්ඩාර උඩුවැල්ල
නි/6431 කපිතන් පරාක්‍රම සිංහගේ සෙනරත් ජයසිංහ
නි/9466 කපිතන් සිංගපුලි ආරච්චිල්ලාගේ චම්පා ධනවර්ධන (ගැ)

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී
යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2022 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

09 - 99

---

# රජයේ නිවේදන

## ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - වලස්මුල්ල

### ඓතිහාසික සිත්තම්ගල්ලෙන රජ මහා විහාරස්ථ ඇසළ මහා පෙරහැර නියෝග

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 175 වැනි අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනත 2 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝග ප්‍රකාරව වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් අයි. ආර්. කේ. විතාරණ වන මම පහත සඳහන් කාලය වලස්මුල්ල සිත්තම්ගල්ලෙන රජමහා විහාරස්ථාන වන්දනා ගමන් ආඥාපනත යටතේ රෙගුලාසි බලපවත්නා කාලය වශයෙන් නියම කරයි.

2022 වර්ෂයේ රජ මහා විහාරස්ථානයේ පෙරහැර මංගල්‍ය 2022.10.05 දින සිට 2022.10.11 දින දක්වා ක්‍රියාත්මක වේ.

අයි. ආර්. කේ. විතාරණ,
ප්‍රාදේශීය ලේකම්,
වලස්මුල්ල.

09-131

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - වාද්දුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

මොරගොඩගේ නිමේෂ් ස්වරණජිත් පෙරේරා සහ වීරක්කොඩි ආරච්චිගේ නිශානි නිලංකා

2022 ජූලි 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මොරගොඩගේ නිමේෂ් ස්වරණජිත් පෙරේරා සහ වීරක්කොඩි ආරච්චිගේ නිශානි නිලංකා වෙත ප්‍රදානය කරන ලද රු. 6,573,000.00ක වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2018.09.09 දින දරන උකස් කිරීමේ සාධන පත්‍රය මගින් මොරගොඩගේ නිමේෂ් ස්වරණජිත් පෙරේරා සහ වීරක්කොඩි ආරච්චිගේ නිශානි නිලංකා යන අය ණයකරුවන් වශයෙන් අංක 00080000363 දරන හිමිකම් සහතිකයේ දක්වා ඇති සහ මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී මොරගොඩගේ නිමේෂ් ස්වරණජිත් පෙරේරා සහ වීරක්කොඩි ආරච්චිගේ නිශානි නිලංකා යන අය විසින් එකී බැඳුම්කරය මත සහ රු. 6,573,000.00ක එකී වාරික ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 00080000363 දරන හිමිකම් සහතිකයේ සවිස්තරව විස්තර කර ඇති උකස් කිරීමේ සාධනපත්‍රය මත 2022 ජුනි 04 වැනි දිනට රුපියල් මිලියන නමයයි එක් ලක්ෂ විසි හය දහස් නමසිය එකොළහයි ශත අසූ අට (රු. 9,126,911.88)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, එතෙක් කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 6,573,000.0ක ප්‍රාග්ධන හිඟය මත 2022 ජුනි 05 වැනි දින සිට වර්ෂයකට 15%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමඟ එකී රු. 9,126,911.88ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක ටීආර් 309 දරන උකස්කිරීමේ සාධනපත්‍රය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පොහොද්දරමුල්ල බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ පොහොද්දරමුල්ලේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 530015 හි බ්ලොක් 01හි අංක 0224 වශයෙන් පෙන්වා ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: අංක 222 හා 223 දරන ඉඩම් කොටස් ද, නැගෙනහිරට : අංක 226 සහ 225 දරන ඉඩම් කොටස් සහ මොල්ලිගොඩ සිට පොතුපිටිය දක්වා පාර ද, දකුණට : අංක 230, 231, 232, 225 සහ 226 දරන ඉඩම් කොටස් සහ බස්නාහිරට : අංක 233 දරන ඉඩම් කොටස ද මායිම් වූ හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි හයයි හතයි නමයක් (හෙක්. 0.0679) විශාලත්වයෙන් යුත් ඉඩම වේ. මෙය 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී තිබේ.

අංක 530015 දරන කැඩැස්තර සිතියමේ අංක 226 දරන ඉඩම් කොටස මතින් වන මාර්ග අයිතියද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

09 - 86/1

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පුත්තලම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

මොහොමඩ් හනීෆා රසික් ෆරීඩ්

2022 ජූලි 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මොහොමඩ් හනීෆා රසික් ෆරීඩ් වෙත ප්‍රදානය කරන ලද රු. 11,000,000.00ක වාරික ණය ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සියල්ලම ලියා සහතික කරන අංක 3856 හා 2005.08.02 දින දරන, අංක 4219 හා 2006.04.01 දින දරන, අංක 4806 හා 2007.03.06 දින දරන, අංක 5080 හා 2007.09.21 දින දරන, අංක 5277 හා 2008.03.14 දින දරන, අංක 5486 හා 2008.09.01 දින දරන සහ අංක 6120 හා 2010.02.18 දින දරන උකස් බැඳුම්කර සහ මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 3857 හා 2012.03.14 දින දරන උකස් බැඳුම්කරය මගින් මොහොමඩ් හනීෆා රසික් ෆරීඩ් විසින් ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී මොහොමඩ් හනීෆා රසික් ෆරීඩ් යන අය මියයන ලද අතර, කොළඹ දිසා අධිකරණයේ අංක ඩීඑස්පී/2/16 දරන නඩුවේ නීති කටයුතු වලින් මියගිය මොහොමඩ් හනීෆා රසික් ෆරීඩ් යන අයගේ බූදලය නියෝජනය කිරීම සඳහා සෙයියදු මොහොමඩ් උම්මුල් හසානා සහ රසාක් ෆරීඩ් වසීම් රිස්වි යන අයව නිසි පරිදි පත්කර තිබේ. ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 මැයි 18 වැනි දිනට රුපියල් මිලියන විසි දෙකයි අට ලක්ෂ දහනම දහස් හයසිය හැටයි ශත හතලිස් පහ (රු. 22,819,660.45)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, එතෙක් කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට විකුණුම් දිනය දක්වා රු. 5,599,659.09ක ප්‍රාග්ධන හිඟය මත 2022 මැයි 19 වැනි දින සිට වර්ෂයකට 16%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමඟ එකී රු. 22,819,660.45ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 3856, 4219, 4806, 5080, 5277, 5486, 6120 සහ 3857 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර

ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු කේ. පී. එන්. සිල්වා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ (නොච්චියාගම උප දිසාපති කොට්ඨාසය තුළ) නොච්චියාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ නොච්චියාගම පිහිටි "නොච්චියාගමකැළේ" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් සාදන ලද අංක 5822 හා 2005.06.29 දින දරන පිඹුරේ (ඒකාබද්ධ කරන ලද) ලොට් 1 සහ 2 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අබ්දුල් හමීඩ් හිමිකම්පාන ඉඩම ද, නැගෙනහිරට : ෆවුසි හිනායා හිමිකම්පාන ඉඩම සහ ප්‍රසන්න බණ්ඩාට අයිති කඩය ද, දකුණට: පුත්තලම සිට අනුරාධපුරය දක්වා (මහ) පාර සහ බස්නාහිරට: උම්මා සහිරා හිමිකම්පාන ඉඩම සහ අශෝකට අයිති කඩය ද මායිම් වූ පර්චස් විසි පහයි දශම හතරයි හය (පර්. 25.46) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

09 - 86/2

---

### සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය

1. බිලූ ඕෂන් වේව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - ගිණුම් අංක : 0017 1001 1881/ 0029 3003 2495
2. බිලූ ඕෂන් රියල්ටි (ප්‍රයිවට්) ලිමිටඩ් - ගිණුම් අංක : 0029 3003 2487/ 0017 1001 0362
3. ලින්ක් ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් - ගිණුම් අංක : 0017 1000 9917/ 0017 1001 0478
4. ලින්ක් ලෙජන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් - ගිණුම් අංක : 0017 1001 1725/ 0029 3003 2576
5. ලින්ක් රෙඩිමික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - ගිණුම් අංක : 0017 1001 4007/ 0029 3003 2568

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.02.25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. දෙල්පෙච්ත්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2016 මාර්තු 10 හා අංක 2146 හා 2016 අප්‍රේල් 04 දාතම හා අංක 2230 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 112194 දරන ශ්‍රී ලංකාවේ සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන බිලූ ඕෂන් වේව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2019 ජූලි 30 හා අංක 4582 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 95018 දරන ශ්‍රී ලංකාවේ සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන බිලූ ඕෂන් රියල්ටි (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන්ද සහ බිලූ ඕෂන් වේව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු වශයෙන්ද පැහැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2019 ජූලි 30 හා අංක 4580 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 163 දරන ශ්‍රී ලංකාවේ සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන ලින්ක් ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් ද, සහ බිලූ ඕෂන් වේව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු වශයෙන්පැහැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2019 ජූලි 10 හා අංක 4578 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති

දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 109528 දරන ශ්‍රී ලංකාවේ සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන ලින්ක් ලෙජන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් ද සහ බ්ලූ ඕෂන් වේව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු වශයෙන් පැහැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2019 ජූලි 30 හා අංක 4574 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 109528 දරන ශ්‍රී ලංකාවේ සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන ලින්ක් රෙඩිමික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් ද, සහ බ්ලූ ඕෂන් වේව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු වශයෙන් ද පැහැර ඇති හෙයින් ද,

එකී අංක 2146, 2230, 4582, 4580, 4578 සහ 4574 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අසූ කෝටි විසි හය ලක්ෂ හැත්තෑ හතර දහස් අටසිය අසූ එකයි ශත අනූ දෙකක (රු. 802,674,881.92) මුදලක් 2021 පෙබරවාරි 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අසූ කෝටි විසි හය ලක්ෂ හැත්තෑ හතර දහස් අටසිය අසූ එකයි ශත අනූ දෙකක (රු. 802,674,881.92) මුදලද, 2021 පෙබරවාරි 03 දින සිට 2146, 2230, 4582, 4580, 4578 සහ 4574 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ කෝටි අසූපන් ලක්ෂ හැටපන් දහස් හතළිස් හතයි ශත අනූ හතක (රු. 708,565,047.97) මුදලක් සඳහා වාර්ෂිකව Average Weighted Prime Lending Rate + සියයට දෙකයි දශම පහක් (2.50%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2146, 2230, 4582, 4580, 4578 සහ 4574 දරන එකී උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තිඹිරිගස්යාය මහා ලේකම් කාර්යාල කොට්ඨාස සහ කොළඹ මහ නගර සභා සීමාවන් තුළ කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොල්ලුපිටිය වෝඩ් අංක 37, කොල්ලුපිටිය පිහිටි 19 වැනි පටුමග, වරිපනම් අංක 6 දරන "සනිඩෙන් සහ සනින් ඩේල්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ගාමිණී බී දොඩන්වල යන අය විසින් සාදන ලද 2016 මාර්තු 29 දාතම හා අංක 11584 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගාලු පාර, වරිපනම් අංක 282/1 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : 19 වැනි පටුමග, වරිපනම් අංක 4 දරන පරිශ්‍රයන්, දකුණට : 19 වැනි පටුමග, බස්නාහිරට : පොලිස් නිළ නිවස පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් පහළොවයි දශම හයයි හතක් (A:0, R:1, P:15.67) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 11584 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව E 203/114 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

09 - 124

---

### සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය

බ්ලූ ඕෂන් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0017 1000 9704

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.02.25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. දෙල්පෙච්ත්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2017 මැයි 07 දාතම හා අංක 1330 දරන සහ 2017 ජනවාරි 06 දාතම හා අංක 1177 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගත කොට

ඇති සමාගමක් වන බ්ලූ ඕෂන් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 1330 සහ 1177 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අට කෝටි තිස් හය ලක්ෂ හැට දෙදහස් හාරසිය තුනයි ශත තුනක (රු. 83,662,403.03) මුදලක් 2021 පෙබරවාරි 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතු ඇති හෙයින් ද, එකී රුපියල් අට කෝටි තිස් හය ලක්ෂ හැට දෙදහස් හාරසිය තුනයි ශත තුනක (රු. 83,662,403.03) මුදල ද, 2021 පෙබරවාරි 03 දින සිට අංක 1330 සහ 1177 දරන උකස් බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය කෝටියක (රු. 60,000,000.00) මුදලක් සඳහා At the rate of Average Weighted Prime Lending Rate + Four Decimal Five Per centum සියයට හතරයි දශම පහක් (AWPLR + 4.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1330 සහ 1177 දරන එකී උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මොරටුව දකුණ ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ කොරළවැල්ල පිහිටි කොරළවැල්ල පාර, වරිපනම් අංක 65/27 දරන "කිරිපැලියගහවත්ත සහ කීනගහවත්ත, කිරිපැල්ලගහ කුඹුර සහ කීනගහ කුඹුර, මාදංගහවත්ත පාවුල ඕවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. ජී. ඩී. අර්සකුලරත්න යන අය විසින් සාදන ලද 2008 පෙබරවාරි 28 දාතම හා අංක 747 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 12, නැගෙනහිරට : මෙහි ලොට් 3, දකුණට: කලින් ටී ගිරිගෝරිස් පීරිස්ගේ දේපළ, බස්නාහිරට : මෙහි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (A:0, R:0, P:20) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 747 දරන එකී පිඹුරට අනුවය.

බලයලත් මානක තැන බී. එල්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1998 මාර්තු 30 දාතම හා අංක 5585 දරන පිඹුරේ ලොට් B දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග ය.

අංක 747 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 2, 1981 ඔක්තෝබර් 28 දාතම හා අංක 948 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 හි නැවත මිනුමක් වන අතර තවත් අයුරකින් පහතින් මැනවින් විස්තර කොට ඇති බලයලත් මානක තැන බී. එල්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1998 මාර්තු 30 දාතම හා අංක 5585 දරන පිඹුරේ නිරූපිත ලොට් A හි නැවත මිනුමක් ද වේ.

එකී කොරළවැල්ල පිහිටි "කිරිපැලියගහවත්ත සහ කීනගහවත්ත, කිරිපැල්ලගහ කුඹුර සහ කීනගහ කුඹුර, මාදංගහවත්ත පාවුල ඕවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. එල්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1998 මාර්තු 30 දාතම හා අංක 5585 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් B, නැගෙනහිරට: අංක 1497 දරන පිඹුරේ ලොට් 12B හි ඉතිරි කොටස, දකුණට: කලින් ටී ගිරිගෝරිස් පීරිස්ගේ දේපළ, බස්නාහිරට : අංක 1497 දරන පිඹුරේ ලොට් 12B හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (A:0, R:0, P:20) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 5585 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 126/09 යටතේ දෙක්ලඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1330 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වැල්ලවත්ත දකුණ ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ, වැල්ලවත්ත මූවර්ස් පාර පිහිටි මුවර්ස් පාර, වරිපනම් අංක 23 සහ 23A දරන "මහවැල්ලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. සිංගනායගම් යන අය විසින් සාදන ලද 1968 නොවැම්බර් 23 දාතම හා අංක 1349 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මූවර්ස් පාර, නැගෙනහිරට : මෙහි ලොට් B, දකුණට: ලොට් D1 සහ D2, බස්නාහිරට : ලොට් 377[01] යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම තුනයි එකක් (A:0, R:0, P:22.31) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 1349 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව SPE 38/32 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1177 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

2022.06.15 දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 2016.06.21 දිනැති අංක 4889 දරන උකස් බැඳුම්කරයට අනුව පිළිවෙලින් (රු. 27,000,000.00) රුපියල් මිලියන විසිහතක කාලීන ණය සහ (රු. 5,000,000.00) රුපියල් මිලියන පහක කෙටිකාලීන ණය මත 2022.05.30 දින තෙක් මුල් මුදල හා හිඟහිටි පොළිය වශයෙන් (රු. 19,756,840.32) රුපියල් එක්කෝටි අනූහත්ලක්ෂ පනස්හයදහස් අටසිය හතලිහයි ශත තිස්දෙකක මුදලක් සමඟ එකී (රු. 27,000,000.00) රුපියල් මිලියන විසිහත ක කාලීන ණයෙහි හිඟහිටි මුල් මුදල මත වරසකට සියයට 28.5% (විසිඅටයි දශම පහ)ක් සහ රු. 5,000,000.00 (රුපියල් මිලියන පහ)ක කෙටි කාලීන ණය මත වසරකට සියයට 28.5% (විසිඅටයි දශම පහ) බැගින් 2022.05.31 දිනය තෙක් ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් උපචිත පොළිය ද බියගම, මාබිම, හෙයියන්තුඩුව අංක 233/2හි පිහිටි සීමාසහිත එස්. පී. ජී. පී. හෝල්ඩින්ග්ස් ලංකා (ප්‍රයිවට්) සමාගමෙන් අයවිය යුතුව ඇත.

2. අංක 4889 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු (රු. 19,756,840.32) රුපියල් එක්කෝටි අනූහත්ලක්ෂ පනස්හයදහස් අටසිය හතලිහයි ශත තිස්දෙකක මුදල සමග 2022.06.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, මෙට්‍රොපොලිටන් ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම හා ණය සුපරීක්ෂණ) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ සහ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මාබිම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාබිම පිහිටි ගනේවෙල පාරේ, වරිපනම් අංක 395 දරන ගොඩපරගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 2002 මාර්තු 31 දිනැති අංක 247/2002 දරන පිඹුරෙහි ලොට් 3A, උතුරට: බලයලත් මිනින්දෝරු කේ. ජී. හියුබර්ට් පෙරේරා විසින් සාදන ලද 1992 ජනවාරි 28 දිනැති අංක 4916 දරන පිඹුරෙහි ලොට් 2 ද, නැගෙනහිරට : පාර (මහා මාර්ගය) ද, දකුණට : අංක 4916 දරන පිඹුරෙහි ලොට් 4 ද, බස්නාහිරට : රම්‍යා චාන්දනී උරුමකම් කියන ඉඩම ද මායිම්ව එකී අංක 247/2002 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් තිස් දෙකක (අ.0, රූ.1, පර්.32) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N239/98හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලංකා බැංකුව,
අගනුවර ශාඛාව.

ඩබ්. එම්. එච්. ඒ. එස්. එස්. බී. ඒකනායක,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු,
(අයකර ගැනීම් හා ණය සුපරීක්ෂණ)

09-150

---

## පැන් ඒෂියා බැංකින් කොපරේෂන් පී. එල්. සී. - ගම්පොල ශාඛාව

### වෙන්දේසිකරු වෙනස් කිරීම

හේවා වැදිගේ සෝමසිරි සහ හේවා වැදිගේ තිලිණ සඳරුවන් යන අය විසින් උකස් කරන ලද දේපළ වෙන්දේසි කිරීම සම්බන්ධයෙන් වර්ෂ 2019 ක්වූ සැප්තැම්බර් මස 27 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද සහ වර්ෂ 2019 ක්වූ සැප්තැම්බර් මස 20 වැනි දින දිවයින, තිනක්කුරල් සහ ද අයිලන්ඩ් පුවත්පත්හි පළ කරන ලද දැන්වීමේ සඳහන්, පැන් ඒෂියා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019ක්වූ අගෝස්තු මස 28 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවෙන් පත් කරන ලද වෙන්දේසිකරු වූ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය බලයලත් වෙන්දේසිකරු වෙනුවට බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති මහතා පත් කිරීම වර්ෂ 2022 ක්වූ ජූලි මස 26 වැනි දින පැන් ඒෂියා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඒකමතිකව අනුමත කර ඇති බව මෙයින් දන්වමු.

ඉහත පත් කිරීම හැර වර්ෂ 2019 ක්වූ අගෝස්තු මස 28 වැනි දින පැන් ඒෂියා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර වර්ෂ 2019 ක්වූ සැප්තැම්බර් මස 27 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, වර්ෂ 2019 ක්වූ සැප්තැම්බර් මස 20 වැනි දින දිවයින, තිනක්කුරල් සහ ද අයිලන්ඩ් පුවත්පත්වල පළ කරන ලද යෝජනා සම්මුතියේ අඩංගු කරුණු නොවෙනස්ව සහ බලාත්මකව පැවතිය යුත්තේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකරු ණය අයකර ගැනීම්.

09-135

---